
යාළුවෝ
අපේ එකමුතු බව
ලිතුලි සියන්සා වික්‍රමසිංහ

# යහළුවෝ

ලිතුලි සියන්සා වික්‍රමසිංහ

08.02.2025

ISBN: 978-624-208-173-1

# පිදුම

අ.. ආ.. අකුරු කරන්නට
උගත මනා ශිල්පය දුන්
ගුරුමෑණිවරුන්ටත් ගුරුපියවරුන්ටත්
උපහාර වේවා !!!!!!

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,<br>
ශෂිකලා සේනාධීර,<br>
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

එකෝමත් එක කාලෙක එක ලස්සන කැලෑවක හාවෙකුයි අලියෙකුයි නරියෙකුයි හිටියා. ඒගොල්ලොත් අපි වගේම සෙල්ලම් කරන්න හරිම ආසයි.

මේ යාලුවෝ හැමදාම ඉස්කෝලෙ ගිහින් ඇවිල්ලා පිට්ටනියට යනවා සෙල්ලම් කරන්න.

ඔන්න එක දවසක් මේ යාලුවෝ ටික විලකට ගියා නාන්න. ඒක හරිම ලස්සන විලක්.

ඕලු, නෙළුම්, මානෙල් මල් පිරිලා. හරිම පිරිසිදු වතුර.



ඉතින් මේ යාලුවෝ විලට බැහැලා රෑ වෙනකන් වතුරෙ සෙල්ලම් කලා.

ටික වෙලාවකින් හා පැංචට හිතුනා දැන් අපේ අම්මලා බලාගෙන ඇති කියලා.

"මේ යාළුවේ අපි දැන් ගෙදර යමු" හා පැංචා කිව්වා.

ඉතින් ඊට පස්සේ මේ යාළුවො ටික ඔක්කොම තම තමන්ගෙ ගෙවල් වලට ගියා.

හැබැයි ඉතින් ගෙදර ගියාට පස්සේ අලි පැංචට හොඳටම උණ හැදුනා.

කැලේ වලස් දොස්තර මාමාගෙන් බෙහෙත් ගන්නත් යන්න වුණා.

ඊළඟ දවසේ යාළුවො ටික ඉස්කෝලෙ ආවා. හැබැයි අලි පැංචා ඇවිත් හිටියේ නෑ.

ඉතින් හා පැංචා ඉස්කෝලේ ඇරිලා අලි පැංචාගේ සුව දුක් බලන්ඩ එයාගේ ගෙදර ගියා.

ඔහොම හා පැංචා යන අතරමගදී එයාට කැරට් පාත්තියක් හම්බුනා.

හා පැංචට කැරට් ටික දැකලා කටට කෙල ඉනුවා.

ඉතින් හා පැංචා හිතුවා කැරට් ටිකක් කාලම යනවා කියලා.

ඔහොම හා පැංචා කැරට් කකා යද්දි දන්නෙම නැතුව උගුලකට අහු උනා.

හා පැංචා හයියෙන් කෑ ගහලා උදව් ඉල්ලුවා.

"අනේ මාව බේරගන්න"
"අනේ මාව බේරගන්න"
"කාට හරි ඇහෙනවද?"



ඒක ඇහුන නරි පැංචා එකපාරටම දුවගෙන ආවා.

ඊට පස්සේ නරි පැංචා ගහ උඩට නගින්න හැදුවා.

ඒත් නරි පැංචට ගහට නගින්න බැරි උනා.

ඊට පස්සේ නරි පැංචාට හිතුනා මට මේ වැඩේ තනියම කරන්න බැනේ ඉන්නකෝ මම අලි පැංචවත් එක්කරගෙනම එන්න ඕනේ කියලා.

"හා පැංචෝ ඔයා ඔතනම ඉන්න. මම ඉක්මනටම අලි පැංචාව එක්කරගෙන එන්නම්."
නරි පැංචා කිව්වා.

නරි පැංචා අලි පැංචාගේ ගෙදර ගිහිල්ලා හා පැංචට වෙච්ච කරදරේ ගැන ඉක්මනින්ම කිව්වා.

“යමු යමු අපි ඉක්මනට හා පැංචා බේරගන්න යමු” අලි පැංචා කිව්වා.

අලි පැංචා තමන්ගෙ අසනීපෙත් අමතක කරලා නරි පැංචාත් එක්ක හා පැංචා බේරගන්න ගියා.

මේ යාළුවෝ දෙන්නා හා පැංචා බේරගන්න යන අතරමගදී ඒගොල්ලන්ට මී පැංචෙක් හම්බුනා.

"මී පැංචෝ ඔයා එනවද අපේ යාළුවාව බේරගන්න?" අලි පැංචා මී පැංචාගෙන් ඇහුවා.


"හා හා මම එන්නම්" මී පැංචා කිව්වා.

ඔන්න දැන් ඒ තුන් දෙනා හා පැංචා ළඟට ගියා.
හා පැංචා බයේ වෙව්ලනවා.

"ඉන්න ඉන්න හා පැංචෝ. මම ඔයාව බේරගන්න එනවා".
මී පැංචා කිව්වා.

“බයවෙන්න එපා යාලුවේ” අලි පැංචා කිව්වා.

ඊට පස්සේ මී පැංචා ඉක්මනින්ම ගහ උඩට නැගලා ලණුව හපන්න පටන් ගත්තා.



"ඔන්න ඔය දෙන්නා ලෑස්ති වෙලා ඉන්න මේ හා පැංචාව අල්ලගන්න" මී පැංචා කිව්වා.

“ඔව් ඔව් අපි ලෑස්තියි.” අලි පැංචා කිව්වා.

මී පැංචා ලණුව හපලා ඉවර වෙනකොටම එයා දැක්කා දඩයක්කාරයා එනවා.

"යාළුවනේ ඉක්මන් කරන්න දඩයක්කාරයා එනවා." මී පැංචා කෑගැහුවා.

අලි පැංචයි, නරි පැංචයි ඉක්මනටම හා පැංචව ඒ උගුලෙන් එළියට ගත්තා.

ඊට පස්සේ යාලුවෝ ටික ඉක්මනට දුවන්න පටන් ගත්තා.

"අනේ යාලුවනේ මට එච්චර හයියෙන් දුවන්න බෑ" මී පැංචා කිව්වා.

නරි පැංචා ආයෙත් දුවලා ගිහිල්ලා මී පැංචව පිට උඩ තියාගෙන දුවගෙන ආවා.

දඩයක්කාරයා දැක්කා එයාගේ උගුලට අහුවෙච්ච සතාව අනෙක් සතුන් එකතුවෙලා බේරගන්නවා.

ඉතින් දඩයක්කාරයාට හොඳටම තරහා ගියා. දඩයක්කාරයා මේ යාළුවන්ව පන්නන්න පටන් ගත්තා.

“ඔයාලා යන්න. මම මේ දඩයක්කාරයාව බය කරලා එන්නම්” අලි පැංචා කිව්වා.

ඔන්න ඊට පස්සේ අලි පැංචා දඩයක්කාරයා එන පැත්තට දුවන්න පටන් ගත්තා.



දඩයක්කාරයා බයවෙලා හයියෙන් දුවගෙන ගියා.

අලි පැංචා දඩයක්කාරයාව කැලෑවෙන් එළියටම පැන්නුවා.

ඊට පස්සේ මේ යාළුවෝ ඔක්කොමලා අලි පැංචාගේ ගෙදර ආවා.


"මොකද මොකද දරුවනේ මේ කලබලේ?"
අලි පැංචාගේ අම්මා ඇහුවා.

ඉතින් මේ යාළුවො ටික වෙච්ච දේ අලි පැංචාගේ අම්මට කිව්වා.

ඔන්න බලන්න දරුවනේ ඔයාලගේ එකමුතුකම නිසා අද හා පැංචාගේ ජීවිතේ බේරගන්න ඕගොල්ලන්ට පුළුවන් උනා.

මට මේ දරුවෝ ගැන හරිම ආඩම්බරයි.

අලි පැංචාගේ අම්මා මේ යාළුවො ටික ආදරෙන් බදාගත්තා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප, පළාත් ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස් වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාතමකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්